සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	විෂයය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	කාලය காலம் Time
11	නර්තනය (දේශීය)	I	පැය 01

නම/විභාග අංකය:- .....

විශේෂ උපදෙස්:

- සියලුම අයදුම්කරුවන් I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. ඊට අමතරව II උඩරට නර්තනය හෝ III පහතරට නර්තනය හෝ IV සබරගමු නර්තනය යන කොටස් තුනෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- II, III හා IV කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා නොගත යුතු ය. ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසටදැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

I කොටස

- 01 සිට 15 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(01) තාල රූප දෙකක් භාවිතවන වන්නමක් ලෙස ..... වන්නම සඳහන් කළ හැකි ය.

1. සිංහරාජ
2. සැවුලා
3. මුසලඩි
4. තුරඟා

(02) ආඝාතාත්මක සහ අනාඝාතාත්මක ලක්ෂණ ද්විත්වයම ..... තුළ අන්තර්ගත ය.

1. ටීකා සීපද
2. කුළු කවි
3. පතුරු කවි
4. මෝල්ගස් කවි

(03) උඩරට වන්නම් නර්තනයේ කවි ගායනය කරනවිට භාවිත අංගහාරය ..... වේ.

1. මණ්ඩිය
2. ගොඩසරඹ
3. හස්ථ චලන
4. ගී මණ්ඩිය

(04) අතීතයේ සිට චාමරය නිර්මාණය කිරීම සඳහා ..... භාවිත විය.

1. නියඳ කෙඳි
2. අශ්ව කෙඳි
3.. කොහු කෙඳි
4.. හණ කෙඳි

(05) ..... සෙල්ලිපිය තුළින් ගහපතියා යනුවෙන් හඳුන්වන ලද නර්තන පරම්පරාවක් සිටි බවට සාධක හමු වේ.

1. පාලමොට්ටායි
2. කාලිංග වනෝද්‍යාන
3. සැස්සේරුව
4. ගල්පොත

(06) ශෝකය නමැති ස්ථායී භාවය තුළින් ..... රසය උපද්දීපනය වේ.

1. ශෘංගාර
2. බීභත්ස්‍ය
3. වීර
4. කරුණා

(07) අණබෙර වාදනයේ දී භාවිතවන විතත වාදන භාණ්ඩය වන්නේ ..... ය.

1. තම්මැට්ටම
2. දවුල
3. ගැටබෙරය
4. බුම්මැඩිය

Past Papers Wiki

(08) වන්නම් නර්තනය අවසානයේ අඩව්ව නර්තනය කරන්නේ ..... පමණ ය.

1. පහතරට නර්තන සම්ප්‍රදායේ
2. උඩරට නර්තන සම්ප්‍රදායේ
3. උඩරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායේ
4. පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායේ

(09) ..... නර්තනය සබ නැටුම් ලෙස හඳුන්වන අර්ධ ශාස්ත්‍රීය නර්තන ගණයට අයත් වේ.

1. පන්තේරු
2. තාලම්
3. පතුරු
4. චාමර

(10) මණ්ඩාරාළ යන චරිතය ඇතුළත් වන්නේ ..... මුද්‍රා නාට්‍යයේ ය.

1. නළ දමයන්ති
2. දියවන්නාව
3. සක්හඬ
4. කරදිය

(11) භරත නාට්‍ය සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය ..... වේ.

1. මෘදංගය
2. චෙණ්ඩාව
3. තබ්ලාව
4. මද්දලය

(12) තුන්තිතේ තාල රූපයක් ප්‍රස්තාරගත කිරීමේ දී භාවිත සංකේත පිළිවෙලින් .....

1. / ^ /
2. / ^ ^
3. ^ ^ /
4. / / ^

(13) සොකරි නාටකයේ සංකේතාත්මක පිළිබිඹුවක් ලෙස ..... භාවිත කරයි.

1. නැවක ආකෘතිය
2. ඊ ගස
3. ගැමි ගෙදර
4. නවකොළ අත්ත

(14) සොකරි නාටකයේ සහ කෝලම් නාටකයේ පූර්ව රංගයේ එන චරිත පිළිවෙලින් ..... වේ.

1. සොකරිය, ගුරුහාමි සහ නොංචි අක්කා, ගුරුළු රාක්ෂ
2. සොකරිය, සිසී සහ ජසයා, මහාසම්මත රජ බිසව
3. ගුරුහාමි, අණබෙරකරු සහ ලෙංචිනා, ගිරිදේවි
4. ගුරුහාමි, පරයා සහ ජසයා, ලෙංචිනා

(15) උඩරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන් හදාරණ ආධුනිකයා විසින් පුහුණු විය යුතු පාද සහ දෑත් භුරුකර ගැනීමේ සරඹ විශේෂය පිළිවෙලින් සඳහන් පිළිතුර තෝරන්න.

1. ගොඩ සරඹ හා ඉලංගම් සරඹ
2. දොඹින පද හා මණ්ඩි පද
3. මණ්ඩි පද හා දණ්ඩි සරඹ
4. ගොඩ සරඹ හා දොඹින පද

- 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා පහත වගුව ඇසුරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

	1 තීරුව	2 තීරුව	3 තීරුව	4 තීරුව
A	1956	රට යකුම හෙවත් රිද්දි යාගය	ප්‍රේමකුමාර එපිටවෙල	සමන් දේවාල පුද සිරිත්
B	බන්දුල ජයවර්ධන	1986	භාරතීය සම්භාව්‍ය නර්තන කලාව	කොහොඹා යක් කංකාරිය හා සමාජය
C	එස්. පණිභාරත	1972	ඔට්ටියානම්	ජිමිකි
D	මෝදිරම්	වංගි	2005	වසන්ත කුමාර

(16) කුඹුරු පනත මුද්‍රා නාට්‍යයේ නිර්මාණ ශිල්පියා නිවැරදිව සඳහන්වන වරණය කුමක් ද?

1. A පේළියේ 3 තීරුව
2. B පේළියේ 1 තීරුව
3. C පේළියේ 1 තීරුව
4. D පේළියේ 4 තීරුව

(17) "හනික වරෙව් කොල්ලනේ....." මෙම ගීතය අයත් නාට්‍යය නිර්මාණය ශිල්පියා සඳහන් පිළිතුර වන්නේ

1. A පේළියේ 3 තීරුව
2. B පේළියේ 1 තීරුව
3. C පේළියේ 1 තීරුව
4. D පේළියේ 4 තීරුව

(18) කැලණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධව තිබූ සෞන්දර්ය අධ්‍යයන ආයතනය සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය නමින් ස්වාධීන විශ්ව විද්‍යාලයක් බවට පත් වූ වර්ෂය සඳහන් වරණය තෝරන්න.

1. A පේළියේ 1 තීරුව
2. B පේළියේ 2 තීරුව
3. C පේළියේ 2 තීරුව
4. D පේළියේ 3 තීරුව

(19) භරත නාට්‍යම් නිළිය විසින් උරහිසට සහ ඉණට පළඳින ආභරණ පිළිවෙලින් සඳහන් පිළිතුර තෝරන්න.

1. D පේළියේ 2 තීරුව C පේළියේ 4 තීරුව
2. C පේළියේ 3 තීරුව සහ D පේළියේ 1 තීරුව
3. C පේළියේ 4 තීරුව D පේළියේ 2 තීරුව
4. D පේළියේ 2 තීරුව සහ C පේළියේ 3 තීරුව

(20) තිස්ස කාරියවසම් මහතා විසින් රචිත පර්යේෂණාත්මක කෘතිය සඳහන් වන නිවැරදි වරණය කුමක් ද?

1. A පේළියේ 2 තීරුව
2. A පේළියේ 4 තීරුව
3. B පේළියේ 3 තීරුව
4. B පේළියේ 4 තීරුව

- 21 සිට 25 තෙක් ප්‍රශ්න සඳහා පහත පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.



A



B



C

(21) C රූපයේ සඳහන් නර්තන ශිල්පිණිය විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍යය කුමක් ද?

1. තන්හා ආශා
2. ගිනිහොරා
3. කුඹි කතාව
4. සේපාලිකා

(22) B රූපයෙන් දැක්වෙන්නේ ..... නර්තන විලාසයකි.

1. භරත නාට්‍ය
2. කථකලි
3. කථක්
4. මණිපුරි

(23) A රූපයේ සඳහන් නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන දේව ශාන්තිකර්මය තුළ භාවිතවන රංග භාණ්ඩයක් වන්නේ කුමක් ද?

1. පොල් පන්දම
2. දුන්න
3. ඊගස
4. තෙල්මෙ තටුව

(24) B රූපයෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදායේ දී පාදයට බඳින ගෙජ්ජි ..... නමින් හඳුන්වයි.

1. ගුංගුරු
2. සලංගෙයි
3. මෝදිරම
4. රහු

(25) C රූපයේ සඳහන් නර්තන ශිල්පිණිය විසින් ..... නර්තනය ප්‍රසංග වේදිකාවට උචිත අන්දමින් සකස්කරන ලදී.

1. පතුරු
2. මෝල්ගස්
3. සවරං
4. රබන්

• **26 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා පහත පින්තූර ඇසුරින්** පිළිතුරු සපයන්න.

(26) මහා දැලියමානා රජු ගිරිබණ්ඩ නම් පූජාවක් කළ බවත් ඒ සඳහා නැටුම්, ගැයුම්, වැයුම් පැවැත් වූ බවත් සඳහන් වන්නේ ..... ය.

1. සැලළිහිණි සංදේශයේ
2. චූල වංශයේ
3. මහා වංශයේ
4. පරෙවි සංදේශයේ

(27) කුඹි කතාව මුද්‍රා නාට්‍යයේ රංග වස්ත්‍රාභරණ නිර්මාණය ..... මහතා විසින් සිදුකර ඇත.

1. මහේෂ් උමගිලිය
2. චිත්‍රසේන ඩයස්
3. ඩබ්.බී.මකුලොළුව
4. සෝමබන්දු විද්‍යාපති

(28) තාල තැබීම සමග ගායනය ආරම්භ කිරීම සහ තාල තැබීමෙන් පසු ගායනය ආරම්භ කිරීම සඳහා භාවිතවන වචන පිළිවෙලින් සඳහන් වරණය වන්නේ,

1. සමග්‍රහ සහ විෂමග්‍රහ
2. අවග්‍රහ සහ විෂමග්‍රහ
3. සමග්‍රහ සහ අවග්‍රහ
4. අවග්‍රහ සහ සමග්‍රහ

(29) නර්තන කලාව හැදෑරීම නිසා පුද්ගලයා තුළ සංවර්ධනයවන ඉන්ද්‍රිය සමායෝජනය තුළින් වර්ධනය නොවන්නේ ..... ය.

1. නම්‍යශීලී බව
2. ආවේගශීලී බව
3. විචාරශීලී බව
4. ස්වයං හික්මීම

(30) "සමාජ සාරධර්ම වර්ධනය වීම ද නර්තන කලාව හැදෑරීමෙන් පුද්ගලයාට ලැබෙන ප්‍රතිලාභයකි." මෙම ප්‍රකාශය හා සම්බන්ධ සාවද්‍ය පිළිතුර කුමක් ද?

1. ආගමට සහ ගුරු - දෙමව්පියන්ට ගරු කිරීම වර්ධනය වේ.
2. අන්‍ය කලාවන්ට ගරු කිරීම වර්ධනය වේ.
3. මානසික ආතතිය වර්ධනය වේ.
4. විචාරශීලීත්වය වර්ධනය වේ.

II කොටස - උඩරට නර්තනය

(31) උඩරට වන්නම් රචනා වූ මුල් යුගයේ ..... ගායනා සඳහා යොදාගෙන ඇති බව කියයි.

1. රාජ සභාවේ
2. කවිකාර මඩුවේ
3. සූවිසි විවරණ තුළ
4. දළදා මාලිගයේ

(32) තුරඟා වන්නම සහ සැවුලා වන්නම පිළිවෙලින් ..... තාලරූපවලට අයත් ය.

1. සුළු තනි තිත සහ සුළු මැදුම් දෙතිත
2. සුළු මහ දෙතිත මැදුම් මහ දෙතිත
3. මහ තනි තිත සහ සුළු මහ දෙතිත
4. සුළු මැදුම් දෙතිත සහ සුළු මහ දෙතිත

(33) ..... යනු උඩරට වෙස් ඇදුම් කට්ටලයේ මැණික්කටුව අසලට පළඳින ආභරණයකි.

1. කෙමෙත්ත
2. අවුල්හැරය
3. පාහිම්පත
4. උරබාහු

(34) විරාඩි වන්නම සහ මණ්ඩුක වන්නම පිළිවෙලින් ..... යන තාලරූපවලට අයත් ය.

1. මාත්‍රා 3+4 දෙතිත සහ මාත්‍රා 4 තනිතිත
2. මාත්‍රා 2+4 දෙතිත සහ මාත්‍රා 2 තනිතිත
3. මාත්‍රා 4 තනි තිත සහ මාත්‍රා 3+4 දෙතිත
4. මාත්‍රා 4 තනි තිත සහ මාත්‍රා 2+3 දෙතිත

(35) සබරගමු ගමන් මාත්‍රය ..... තාලරූපයට අයත් ය.

1. සුළු මහ දෙතිත
2. සුළු තනි තිත
3. මැදුම් තනි තිත
4. මැදුම් මහ දෙතිත

(36) ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය විසින් රචිත පර්යේෂණ කෘතියක් වන්නේ ..... ය.

1. ශාන්තිකර්ම හා සිංහල සමාජය
2. සිංහල නර්තන කලාව
3. රට යකුම හෙවත් රිද්දි යාගය
4. සමන් දේවාල පුද සිරිත්

(37) "ගත්තකු දිත් තා දොංගඩ තරිකිට දිත් තා...." යනුවෙන් ආරම්භ වන අඩව්ව ..... වන්නමට නර්තනය කළ හැකි ය.

1. විරාඩි
2. කදම්භ පක්ෂි
3. කොවුලා
4. මණ්ඩුක

(38) ..... යන බෙර සරඹය දවුලෙන් වාදනය කරයි.

1. ජිංත තකට
2. ගුංද ගතිගත
3. ජිංත ගතට
4. තකට ජිකට

(39) ගුඳ ගති ගත වට්ටමේ පදය නර්තනයෙන් පසු ඉරට්ටියට පෙර ..... නර්තනය කරයි.

1. සුරල
2. ගමන්තාලය
3. අන්තාදිය
4. මෝසොම් පද

(40) සබරගමු නර්තන සම්ප්‍රදායේ මූලික සරඹ අභ්‍යාසයෙන් පසු ආධුනික නර්තකයා විසින් ..... අධ්‍යයනය කළ යුතු ය.

1. ගමන් මාත්‍රය
2. සින්දු මාත්‍රය
3. මුල් මාත්‍රය
4. පට්ටුතල් මාත්‍රය

Past Papers Wiki
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	විෂය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	කාලය காலம் Time
11	නර්තනය (දේශීය)	II	පැය 02

II පත්‍රය

සැලකිය යුතුයි :

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට (5) පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දොළහ (12) බැගින් හිමි වේ.

---

(01) සියලු ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි කෙටි පිළිතුරු ලියන්න.

(i) උඩරට වන්නම් නිර්මාණය සඳහා ගණිතාලංකාර බ්‍රාහ්මණයා විසින් රචිත ..... ග්‍රන්ථය මූලාශ්‍ර කරගත් බව සඳහන් වේ.

(ii) භරත නාට්‍යම් නම් වූ නර්තන සම්ප්‍රදාය මූලාරම්භයේ දී ..... ලෙස හඳුන්වා ඇත.

(iii) මුද්‍රා භාවිතයට වඩා චලන, ඉඟි, පසුබිම් ගායනය භාවිත කිරීම නිසා දේශීය මුද්‍රා නාට්‍ය ..... ලෙස හැඳින් වේ.

(iv) වීරත්වය විදහා දක්වන ගැමි නර්තනයකි .....

(v) උත්සාහ නම් වූ ස්ථායී භාවය තුළින් ..... රසය උපදී.

(vi) කථකලි නර්තනය බිහිවීමට පාදක වූ ගැමි නාටකයක් ලෙස ..... සැලකෙයි.

(vii) පත්තිනි දේවියගේ උපත් කතාවක් නිරූපණයවන දෙවොල් මඩු යාගයේ මෙන්ම පහන් මඩු යාගයේ ද දැකිය හැකි නාට්‍යමය පෙළපාලියකි .....

(viii) අතීත ලංකාවේ නර්තන කලාව පිළිබඳ තොරතුරු විමසීමේ දී දේවදාසීන් සිටි බව ..... ශිලා ලිපියේ සඳහන් වේ.

(ix) කුඹි කතාව මුද්‍රා නාට්‍යයේ රංග රචනය ..... විසින් සිදු කරන ලද අතර එය ප්‍රථම වරට ..... වර්ෂයේ දී වේදිකාගත කරන ලදී.

(x) මළ බෙර වාදනයේ භාවිත අවනද්ධ වාද්‍ය භාණ්ඩයක් සහ සුසිර වාද්‍ය භාණ්ඩය ලියන්න.

අ. අවනද්ධ වාද්‍ය භාණ්ඩය : .....

ආ. සුසිර වාද්‍ය භාණ්ඩය : .....

(ලකුණු 1 x 12 = 12)

(02) (i) පහත සඳහන් බෙර පද / දවුල් පද අතරින් තමන් ඉගෙනගන්නා සම්ප්‍රදායට අයත් බෙර පදය/ දවුල් පදය නියමිත තාලරූපයට ප්‍රස්තාර කරන්න.

- දෝං ජිං ජිං තකට දොංතක
- දිත් තම් දිතම් දොං දොං තා
- කුඳත් තත්කිට තකට ජිම්තකු

(ලකුණු 4)

(ii) පහත දක්වා ඇති කවිය නියමිත තාලරූපයට ප්‍රස්තාර කරන්න.

ත්‍රිවිධ ඥණ විදුරු පඬි අපෙ මහ
ගෞතම නම් මුණිඳු එ බුදු වූ
ගෞතම නම් මුණිඳු

(ලකුණු 4)

(iii) මුසලඩි වන්නමේ / ශුද්ධ තාලය සින්දු වන්නමේ / කොවුලා වන්නමේ කස්තිරම / ඉරට්ටිය / කලාසම ප්‍රස්තාර කරන්න.

(ලකුණු 4)

(03) පහත සඳහන් මාතෘකා අතරින් තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) සතර අභිනය

(ii) ආචාර්ය වජිරා චිත්‍රසේන

(iii) වන්නම්

(iv) ශාන්තිකර්ම තුළ භාවිත රංග භාණ්ඩ

(v) ගැමි නැටුම්

(ලකුණු 4×3=12)

(04) කෝලම් නාටකය විචිත්‍රත්වයෙන් යුක්තවන අතරම එහි කතා ප්‍රවෘත්තිය තුළින් සමාජ ශෝධනය ද විද්‍යමාන කරයි.

(i) කෝලම් නාටක සඳහා භාවිතවන ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩය සහ සුසිර වාද්‍ය භාණ්ඩය නම් කරන්න.

(ලකුණු 02)

(ii) මෙම ජන නාටකයේ කතා පුවත සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 04)

(iii) කෝලම් නාටකයේ පූර්ව රංගයේ චරිත දෙකක් ඇසුරින් සමාජ ශෝධනය විද්‍යමානවන ආකාරය විමසන්න.

(ලකුණු 06)

(05) ලක්දිව නර්තන කලාව විවිධ යුගවල දී පැවති ආකාරය පිළිබඳ මූලාශ්‍රයන් හි අන්තර්ගත සාධක අනුව මැනවින් විද්‍යමාන වේ.

(i) අනුරාධපුර යුගයේ ලක්දිව නර්තන කලාව පිළිබඳ තොරතුරු ලබාගතහැකි ශිලා ලිපි දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

(ii) 1970න් පසු නර්තන කලාවේ අධ්‍යාපනික සංවර්ධනය උදෙසා සිදු වූ සේවය සඳහා කරුණු දෙකක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 02)

(iii) ලක්දිව නර්තන කලාව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබුනු ආකාරය පහත යුග දෙක බැගින් ඉදිරිපත් කරමින් විස්තර කරන්න. සඳහා කරුණු

- අනුරාධපුර යුගය සහ පොළොන්නරු යුගය

(ලකුණු 08)

(06) පහත දැක්වෙන පින්තූර ඇසුරින් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.



A



B

(i) A රූපය ඇසුරින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

අ. මෙම රූපයේ සඳහන් නර්තන සම්ප්‍රදාය සඳහා වර්තමානයේ භාවිතා කරනු ලබන ප්‍රධාන අවනද්ධ භාණ්ඩය කුමක් ද?

ආ. මෙම නර්තන සම්ප්‍රදාය හා බැඳි ප්‍රධාන ගුරුකුල දෙකක් නම් කරන්න.

(ලකුණු 03)

(ii) B රූපය තුළින් දැක්වෙන නර්තන සම්ප්‍රදාය ඇසුරින් පහත ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

අ. මෙම නර්තන සම්ප්‍රදාය උගන්වන ප්‍රධාන ආයතනය කුමක් ද?

ආ. මෙම සම්ප්‍රදාය තුළ දැකිය හැකි නර්තන අංග දෙකක් නම් කරන්න.

(ලකුණු 03)

(iii) B රූපයේ සඳහන් නර්තන සම්ප්‍රදායේ සංගීතය සහ රංග වස්ත්‍රාභරණ පිළිබඳ තොරතුරු දක්වන්න.

(ලකුණු 06)

(07) (i) අද්‍යයනනයේ රූපවාහිනී නාලිකා තුළ විකාශය වූ නර්තන හා සම්බන්ධ වැඩසටහන් දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

(ii) නර්තනයට උචිත අයුරින් රංග වස්ත්‍රාභරණ නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.

(ලකුණු 02)

(iii) අද්‍යයනන තාක්ෂණික ක්‍රම ශිල්ප මගින් නර්තනයේ ප්‍රාසාංගික ගුණය තීව්‍රකරයි. මෙම ප්‍රකාශය කරුණු තුනක් ඔස්සේ විග්‍රහ කරන්න.

(ලකුණු 08)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation - 2026

ශ්‍රේණිය தரம் Grade	විෂයය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	පැය மணித்தியாலம் Hours
11	නර්තනය (දේශීය)		

I පත්‍රය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01	**iii**	11	**i**	21	**i**	31	**ii**
02	**i**	12	**iii**	22	**iii**	32	**iv**
03	**iv**	13	**i**	23	**iv**	33	**i**
04	**i**	14	**iv**	24	**i**	34	**iii**
05	**ii**	15	**iv**	25	**ii**	35	**iii**
06	**iv**	16	**i**	26	**iii**	36	**iv**
07	**ii**	17	**ii**	27	**i**	37	**i**
08	**iii**	18	**iv**	28	**iii**	38	**iv**
09	**i**	19	**iv**	29	**ii**	39	**iii**
10	**iv**	20	**i**	30	**iii**	40	**i**

(ලකුණු 1 × 40 = 40)

II පත්‍රය

01. i. නෙර්තමාලය

ii. දාසිආට්ටම්

iii. ඉඟිනළු

iv. හටන් නර්තනය

v. වීර

vi. චකියාර් කූත්තු/ කුඩියාට්ටම්

vii. අඹ විදමන

viii. පාලමොට්ටායි

ix. අංජලිකා චිත්‍රසේන/ අංජලිකා මෙල්වානි, 2007

x. අ. තම්මැට්ටම, දවුල

ආ. හොරණෑව **(ලකුණු 1 × 12 } 12)**

02. අදාල තාලරූපයට නිවැරදිව ප්‍රස්තාරකර තිබීම. **(ලකුණු 4 × 3 } 12)**

03.

i. සතර අභිනය

- නන්දිකේෂ්වරගේ අභිනය දර්පනයේ තොරතුරු ඇත.
- ආංගික, වාචික, සාත්වික, ආහාර්ය යන අභිනය සතර පිළිබඳ උදාහරණ ද ඇසුරින් තොරතුරු දක්වා තිබීම.
- අංග. ප්‍රත්‍යංග, උපාංග අභිනය සඳහා දායකවන බව දක්වා තිබීම.
- ආහාර්ය අභිනයේ කොටස් දෙකවන අංගරචනය සහ වෙස්මෝස්තර රචනය පිළිබඳ තොරතුරු දක්වා තිබීම.

ii. ආචාර්ය වජිරා චිත්‍රසේන

- වජිරා චිත්‍රසේන මහත්මියගේ පෞද්ගලික තොරතුරු, ඇය විසින් නර්තන/ රංගන දායකත්වය සපයා ඇති නිර්මාණ, ඇය විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍ය දක්වා ගිබීම.

iii. වන්නම්

- වන්නම් යන පදයේ අර්ථය හඳුන්වා තිබීම.
- නර්තන සම්ප්‍රදායන් තුනට අදාලව වන්නම් පිළිබඳ විස්තර දක්වා තිබීම.
- වන්නම් මුල් කාලීනව භාවිතා වූ ආකාරය පැහැදිලි කිරීම.
- වන්නම් රදනාවීම පිළිබඳ තොරතුරු සැකෙවින් දක්වා තිබීම.
- වන්නම් රචනාකිරීමට මුල් වූ/ රචනා කළ පුද්ගලයන් දක්වා තිබීම.
- වන්නම්වල ව්‍යුහය සම්ප්‍රදායන් තුනට අදාලව වෙන් වෙන් වශයෙන් දක්වා තිබීම.

iv. ශාන්තිකර්ම තුළ භාවිත රංග භාණ්ඩ

- ශාන්තිකර්ම තුළ භාවිතාවන රංග භාණ්ඩ එක් එක් නර්තන සම්ප්‍රදායට අදාලව වෙන් වෙන් වශයෙන් දක්වා තිබීම.
- එම රංග භාණ්ඩ භාවිතා කරමින් නර්තනයේ යෙදෙන නර්තන අංග පිළිබඳ හඳුන්වා තිබීම.

v. ගැමි නැටුම්

- ගැමි නැටුම් යනු මොනවාද සහ ඒවා බිහි වූයේ කෙසේද යන්න විස්තර කිරීම.
- ගැමි නැටුමක ලක්ෂණ විස්තර කිරීම.
- ගැමි නැටුම් නම්කර තිබීම.
- එක් එක් ගැමි නැටුම සඳහා භාවිත රංග භාණ්ඩ පිළිබඳ තොරතුරු දක්වා තිබීම.

(ලකුණු 4 × 3 } 12)

Past Papers Wiki

04.

i. දෙවොල් බෙරය/ පහතරට බෙරය, හොරණෑව **(ලකුණු 02)**

ii. මහාසම්මත රජ බිසවගේ දොළදුක සන්සිඳවීමට කෝලම් නාටකය ප්‍රථමයෙන් රඟ දක්වා ඇති බව සඳහන්වන උපත් කතාව සැකෙවින් ලියා තිබීම. **(ලකුණු 04)**

iv. පූර්ව රංගයට අයත් අණබෙර, නොංචි, ජසයා, ලෙංචිනා, මුදලි වැනි පණ්විඩ කෝලම් ආශ්‍රයෙන් පිළිතුරු ලියා තිබීම. **(ලකුණු 06)**

05.

i. සැස්සේරුව, කොරවක්ගල **(ලකුණු 02)**

ii. • 1972 රජයේ පාසල්වලට සෞන්දර්ය විෂය අනිවාර්ය විෂයක් වීම සහ ගිරාගම සෞන්දර්ය ගුරු විද්‍යාලය ආරම්භ කිරීම.

• 1974 කැලණිය විශ්ව විද්‍යාලය අනුබද්ධකර සෞන්දර්ය අධ්‍යයනායතනය ආරම්භ කිරීම.

• 1978 උසස් පෙළ විෂය ධාරාවට නර්තන විෂය ඇතුළත් කිරීම.

• 1986 ජාතික අධ්‍යාපන ආයතනය යටතේ සෞන්දර්ය දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් විෂය නිර්දේශ. ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම. **(ලකුණු 02)**

iii. යුග ඇසුරින් තොරතුරු ලියා තිබීම. **(ලකුණු 08)**

06.

i. අ. තබ්ලාව

ආ. ලක්නව් ඝරානා, බෙනාරිස් ඝරානා, ජායිපූර් ඝරානා, රායිගර් ඝරානා **(ලකුණු 03)**

ii. අ. ශාන්ති නිකේතනය

ආ. රාස්ලීලා, සංකීර්තන්, පරේංග් **(ලකුණු 03)**

iii. • උත්තර භාරතීය රාගධාරී සංගීත සම්ප්‍රදාය.

• ප්‍රධාන අවනද්ධ භාණ්ඩය පුංග්.

• තාලම්පට, බටනලාව, එස්රාජය භාවිතා කරයි.

• පෙනකොම්බා නම් වූ එක් තතක් සහිත අලුවකින් වයන වාද්‍ය භාණ්ඩයක් භාවිතා කරයි.

(ලකුණු 06)

PAST PAPERS WIKI

Past Papers Wiki

07.

i. නර්තනය හා සම්බන්ධව විකාශය වූ වැඩසටහන් නම්කර තිබීම. **(ලකුණු 02)**

ii.
- වර්ණ ගැලපීම.
- සම්ප්‍රදායට උචිත බව.
- සංස්කෘතියට ගැලපීම.
- නිර්මාණාත්මක බව. **(ලකුණු 02)**

iii.
- ආලෝකකරණය
- අධිවේගී හා මන්දගාමී දර්ශන
- සමීප දර්ශන යොදා ගැනීම.
- ශබ්ද පාලනය
- ගායනය සහ වාදනය සඳහා තාක්ෂණික ශිල්ප ක්‍රම යොදා ගැනීම ආදිය. **(ලකුණු 08)**

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library